චක්‍රලේඛ අංක : 06 / 2015

මගේ අංකය : DO/ 01/ 1-2015
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක : 109, මහ වීදිය,
බත්තරමුල්ල.
2015-11- ೦೨

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු, සණස සමිති, සමුපකාර මණ්ඩල සහ සමුපකාර සමිති/ සංගම් සභාපතිවරුන් වෙත,

<u>බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකත්වය ලබාගැනීම</u>

බස්නාහිර පළාත් සභාවේ 2010 අංක 06 දරණ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 6 වන වගන්තිය අනුව 2010.10.11 දිනට පසු සේවයට බැඳෙන සමුපකාර සේවකයින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අනිවාර්යයෙන් දායකත්වය ලබාගත යුතු වේ.

02. එබැවින්, බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අනිවාර්යයෙන් දායකත්වය ලබාගත යුතු වන බව සහ ඒ අනුව විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සඳහා අනිවාර්ය හිමිකම් ලබන බව සඳහන් විධිවිධානයන් සමුපකාර සේවක පත්වීම් ලිපියට ඇතුළත් කිරීමට මෙම කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

03. ඒ අනුව, සමුපකාර කාර්ය විධිවිධාන සංග්‍රහයේ III පරිශිෂ්ඨයේ 02 වන ඡේදයත්, 09 වන ඡේදයත් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. මෙම තනතුර ස්ථිරය. **බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අනිවාර්යයෙන් දායකත්වය ලබාගත යුතුවේ.** තවද ඔබගේ පත්වීම කලින් අවසන් කරනු නොලැබුවහොත්, ඔබගේ පත්වීමේ දින සිට අවුරුදු දෙකක(02) කාලයක් හෝ එම කාලය දීර්ඝ කිරීම අවස්ථානුරූපයයි සලකනු ලැබුවහොත් එසේ දීර්ඝ කළ කාලයක් හෝ ඔබ පරිවාසය පිට සිටිය යුතුය.

09. (i) ඔබගේ වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. (සමිතිය / සංගමය විසින් ද 12 % ක් අර්ථසාධක අරමුදලට දායක වශයෙන් ගෙවනු ඇත. )

(ii) ඔබගේ වැටුපෙන් 5% ක් බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. (සමිතිය / සංගමය විසින් ද 2.5% ක් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලට දායක වශයෙන් ගෙවනු ඇත. )

කොමිෂන් සභා නියමය පරිදිය.

එස්. ඒ. එල්. රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :
01. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත
02. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත.
03. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්
04. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් **(කොළඹ/ගම්පහ/කළුතර)**
05. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
06. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්